**කැළණි ගඟ ඉහලින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2015**

**-------------------------------------------------------------------------**

කැළණි ගඟ ඉහලින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය (ජඅසනි) අතර 2014 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී-III දරන ණය ගිවිසුමේ 01 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය, මහමාර්ග සහ නාවික කටයුතු අමාත්‍යාංශය, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහල සංවලතා සම්බන්ධකයක් ලෙස කැළණි ගඟ ඉහලින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් වාහන තදබදය අවම කිරීම හා විසුරුවා හැරීම මෙන්ම එමඟින් කොළඹ නගරයේ ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය දිරිගැන්වීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 34,788 කට සමාන ජපන්යෙන් මිලියන 46,446 ක් වන අතර ඉන් රු.මිලියන 26,230 කට සමාන ජපන්යෙන් මිලියන 35,020 ක් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජූලි 01 නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මතය**

----------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කාර්යාල කුලී වටිනාකම රු. 240,000 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ හා ජංගම වගකීම් යටතේ දක්වා ඇති ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රු. 82,649 ක් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේවෙතත් මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ව්‍යාපෘතියෙන් ලැබිය යුතු ශේෂ කිසිවක් නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | ජයෙ මිලියන | රු. මිලියන | රු. මිලියන | ජයෙ මිලියන | රු. මිලියන | ජයෙ මිලියන | රු. මිලියන |
| ජඅසනි | 35,020 | 26,230 | 1,728 | 899.56 | 1,033.10 | 899.56 | 1,033.10 |
| ශ්‍රීලංර | 11,426 | 8,558 | 459 | 376.17 | 458.93 | 377.48 | 460.53 |
| **එකතුව** | **46,446** | **34,788** | **2,187** | **1,275.73** | **1,492.03** | **1,277.04** | **1,493.63** |

## 3.2 භෞතික ප්‍රගතිය

ලැබුණු තොරතුරු අනුව, පාලමේ, විදුලි සම්ප්‍රේෂණ මාර්ගය හා ව්‍යාපෘතිය විසින් ඉදිකිරීමට අපේක්ෂිත අනෙකුත් ගොඩනැගිලිවල විස්තරාත්මක සැලසුම් 2015 දෙසැම්බර් 31 ට නිමකර තිබුණි. කෙසේවෙතත් පහත දක්වා ඇති විවිධ හේතු නිසා ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමේ අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

(අ) ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ සැලසුම් අනුව, කිලෝවෝල්ට් 220 හා කිලෝවෝල්ට් 132 අධිබලැති ගුවන් සම්ප්‍රේෂණ මාර්ග අවශ්‍ය මාර්ග ඉඩකඩ ලබාදීමට හැකිවන පරිදි භූගත රැහැන්වලට පරිවර්තනය කිරීමට අපේක්ෂිතය. ඒ සඳහා වන රු. මිලියන 1,240.88 ක ඇස්තමේන්තු පිරිවැය මාර්ග සංවර්ධන අධිකාරිය හා ලංකා විදුලිබල මණ්ඩලය අතරේ බෙදා ගැනීමට අපේක්ෂිතය. කෙසේවෙතත් අදාළ වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේ ලංසු පරිපාටිය 2015 දෙසැම්බර් 31 දින වනවිටත් ලංකා විදුලිබල මණ්ඩලය විසින් අවසන් කර නොමැත. තවද, උප මධ්‍යස්ථාන 02 ක්, පෝෂක කුළුණු 06 ක්, අතුරු පෝෂක කුළුණු 02 ක් යලි ස්ථාන ගත කිරීම, මාර්ග සඳහා වෙන්කළ නව මායිම් දිගේ අධිබලැති භූගත විදුලි රැහැන් යලි එලීම, ද්විත්ව මාර්ග අංශ සඳහා මධ්‍යම, අඩු වෝල්ටීය ගුවන් රැහැන් විතැන් කිරීම හා කැළණි ගඟ හරහා මධ්‍යම, අඩු වෝල්ටීය ගුවන් රැහැන් යලි ස්ථාන ගත කිරීම ආදී වැඩ 2015 දෙසැම්බර් 31 දිනට මූලික අදියරෙහි තිබුණි.

(ආ) අදාළ ඉඩමේ නීතිමය හිමිකම පැවරීමේ ගැටලුවක් හේතුවෙන් කොටිකාවත්තේ ඉඩමක මාර්ග සංවර්ධන අධිකාරියේ සේවක නිල නිවාසවල ඉදිකිරීම් වැඩ 2015 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භකර නොමැත. කෙසේවෙතත් පාංශු පරීක්ෂණ කටයුතු වෙනුවෙන් 2015 දෙසැම්බර් 29 දින පුද්ගලික පාර්ශවයක් වෙත ව්‍යාපෘතිය විසින් රු. 190,210 ක් ගෙවා තිබුණි.

(ඇ) 2015 මාර්තු 19 දින අරඹන ලද 2016 ජූලි 15 දින නිමකිරීමට අපේක්ෂිත හල්බරාවේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ මහජන විරෝධතා හේතුවෙන් අත්හැරදමා තිබුණි. මධ්‍යම පරිසර අධිකාරියේ වාර්තා අනුව, නව ස්ථාන වෙත ගොඩනැගිලි ගෙනයාම මඟින් පාරිසරික කරුණු මත අහිතකර බලපෑමක් නොමැති බව තහවුරු කර ඇත. කෙසේවෙතත් ප්‍රදේශයේ ජනතාව දැනුවත්කර මහජන විරෝධතාවයන් පාලනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු. මිලියන 419.07 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2015 මාර්තු 09 දින පිරිනමා තිබුණු බවත් එයින් රු. මිලියන 34.72 ක් සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත්කරු වෙත ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ඡේද අංක 14.2 වන කොන්ත්‍රාත් කොන්දේසිය අනුව, ප්‍රමාණ බිල්පතෙහි ඇතුළත් අවිනිශ්චිතතා සඳහා වෙන්කිරීම්, දෛනික වැඩ හා භෞතික හා මිල විචලතාවයන් සඳහා වෙන්කිරීම් ආදිය ඉවත්කර පිළිගත් කොන්ත්‍රාත් වටිනාකම ගණනය කළ යුතුය. කෙසේවෙතත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ හා මෝටර් වාහන ඉංජිනේරු පුහුණු ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තු වෙනුවෙන් අවිනිශ්චිතතා, භෞතික හා මූල්‍ය විචලතා එකතුව රු. මිලියන 157.88 ක් ඇතුළත්ව ව්‍යාපෘතිය විසින් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වටිනාකම රු. මිලියන 291.24 කට ගණනය කර ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. මිලියන 24.56 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවා තිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ ගැටලු**

**-----------------------------------------------------**

ප්‍රධාන ඉංජිනේරු, ක්ෂේත්‍ර ඉංජිනේරු, තාක්ෂණික නිලධාරින්, ව්‍යාපෘති ගණකාධිකාරී, ඉඩම් අත්පත්කර ගැනීමේ නිලධාරී, සහකාර ඉඩම් අත්පත්කර ගැනීමේ නිලධාරී, ප්‍රසම්පාදන විශේෂඥ, ප්‍රමාණ මැණුම් නිලධාරීන් හා පරිපාලන නිලධාරී ඇතුලුව ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ ප්‍රධාන තනතුරු 2015 දෙසැම්බර් 31 දිනට වසර 02 කට වඩා පුරප්පාඩු වී තිබුණු බවත් එය ව්‍යාපෘති කටයුතුවල මෙහෙයුම් පහසුව සඳහා අහිතකර ලෙස බලපා ඇති බවත් නිරීක්ෂණය විය.

**3.5 මූල්‍ය පාලනයේ ගැටලු**

**--------------------------**

ව්‍යාපෘතිය සතු දේපල, යන්ත්‍ර සහ පිරියතවල භෞතික පැවැත්ම තහවුරු කිරීමට මුදල් රෙගුලාසි අංක 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.